# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1783/26 - 2012 නොවැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2012.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 6/78.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතේ 15 වැනි වගන්තිය සමග කියවිය යුතු 22 වැනි වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද සමරසිංහ,
වැවිලි කර්මාන්ත අමාත්‍ය.

කොළඹ දී ය.

නියෝග

2001 නොවැම්බර් මස 05 වැනි දින අංක 1209/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මගින් හා 2011 අප්‍රේල් මස 11 වැනි දින අංක 1701/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මගින් අවසන් වරට සංශෝධිත 1989 සැප්තැම්බර් මස 22 වැනි දින අංක 576/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1989 කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ (තේ වගා කිරීමේ) සහනාධාර නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

1. එහි 3 වැනි නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :

"3(1) රිකිලි පැළ කිරීමෙන් වර්ධනය කරන ලද තේ පැළ වගා කිරීමට සුදුසු වූ කුඩා තේ වත්තක හෝ වෙනත් තේ වත්තක මුළුමනින්ම නැතහොත් යම් නිශ්චිත කොටසකට, 2012 ජනවාරි මස 1 වැනි දින සිට බලපවත්නා පරිදි නිකුත් කරන ලද අවසර පත්‍රයක් මත, ගෙවිය යුතු සහනාධාර මුදල් ප්‍රමාණය වගා කළ යුතු ප්‍රදේශයේ හෙක්ටයාරයකට රු. 1,50,000 බැගින් විය යුතු අතර එය පහත දැක්වෙන ආකාරයට ගෙවනු ලැබිය හැකි ය :-

(අ) තේ වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයේ දැනට පවත්නා තුරුලිය මුලිනුදුරා දමා අවශ්‍ය පස සංරක්ෂණ ක්‍රම යෙදීම වෙනුවෙන් හෙක්ටයාරයකට රු. 50,000 බැගින් වූ ප්‍රථම වාරිකය ගෙවනු ලැබිය හැකි ය ;

(ආ) තේ වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයේ පස පුනරුත්ථාපනය කිරීම සඳහා තෘණ වගා කොට මාස හයකට (6) පසුව හෙක්ටයාරයකට රු. 15,000 බැගින් වූ දෙවන වාරිකය ගෙවනු ලැබිය හැකි ය ;

(ඇ) තේ වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයේ පස පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් තෘණ වගාකොට මාස දහඅටකට (18) පසුව හෙක්ටයාරයකට රු. 15,000 බැගින් වූ තුන්වන වාරිකය ගෙවනු ලැබිය හැකි ය ;

(ඈ) තේ වගා කිරීම සම්පූර්ණ කරලීම වෙනුවෙන් හෙක්ටයාරයකට රු. 70,000 බැගින් වූ හතරවන වාරිකය ගෙවනු ලැබිය හැකි ය.

(2) 2012 ජනවාරි මස 1 වැනි දිනට පෙර රිකිලි පැළ කිරීමෙන් වර්ධනය කරන ලද තේ පැළ වගා කිරීම සඳහා මෙම නියෝග යටතේ නිකුත් කරන ලද වලංගුභාවය ඉකුත් නොවූ අවසර පත්‍රයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු සහනාධාර මුදල එම අවසරපත්‍ර නිකුත් කරන අවස්ථාවේ දක්වා ඇති ප්‍රමාණයෙන්ම විය යුතු අතර එහි දක්වා ඇති ආකාරයට ගෙවිය හැකි ය.".

2. එහි 4 වැනි නියෝගය වෙනුවට, පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"4. කුඩා තේ වත්තක හෝ වෙනත් තේ වත්තක මුළුමනින්ම හෝ යම් නිශ්චිත කොටසක, අධිකාරිය විසින් නියම කරනු ලබන අවශ්‍යතාවලට අනුකූලව පිළියෙල කරන ලද ඉඩමක, රිකිලි පැළ කිරීමෙන් වර්ධනය කළ තේ පැළ නැවත වගා කිරීම සඳහා ගෙවිය හැකි සහනාධාර මුදල් ප්‍රමාණය, එසේ නැවත වගා කරනු ලබන ප්‍රදේශයේ හෙක්ටයාරයකට රු. 3,00,000 ක් විය යුතු අතර, එම මුදල පහත සඳහන් ආකාරයට වාරික පහකින් ගෙවනු ලැබිය හැකි ය :-

(අ) තේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ තිබෙන තේ ගස් හෝ වෙනත් තුරුලිය මුලිනුදුරා දමා අවශ්‍ය පස සංරක්ෂණ ක්‍රම යෙදීම වෙනුවෙන් හෙක්ටයාරයකට රු. 80,000 බැගින් ප්‍රථම වාරිකය ගෙවනු ලැබිය හැකි ය ;

(ආ) තේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ පස පුනරුත්ථාපනය කිරීම සඳහා තෘණ වගා කොට මාස හයකට (6) පසුව හෙක්ටයාරයකට රු. 30,000 බැගින් වූ දෙවන වාරිකය ගෙවනු ලැබිය හැකි ය ;

(ඇ) තේ නැවත වගා කරනු ලබන බිම් ප්‍රමාණයේ පස පුනරුත්ථාපනය කිරීම සඳහා තෘණ වගා කොට මාස දහඅටකට (18) පසුව හෙක්ටයාරයකට රු. 45,000 බැගින් වූ තුන්වන වාරිකය ගෙවනු ලැබය හැකි ය ;

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීම සඳහා හෙක්ටයාරයකට රු. 1,15,000 බැගින් වූ හතරවන වාරිකය ගෙවනු ලැබිය හැකි ය ;

(ඉ) නැවත වගාකරන ලද තේ පැළ අවුරුද්දක කාලයක් සතුටුදායක ලෙස නඩත්තු කිරීම සඳහා හෙක්ටයාරයකට රු. 30,000 බැගින් වූ පස්වන වාරිකය ගෙවනු ලැබිය හැකි ය.".

3. එහි 5 වැනි නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"5.(1) 2012 ජනවාරි මස 1 වැනි දින සිට බලපවත්නා පරිදි කුඩා තේ ඉඩම් වෙනුවෙන් නිකුත් කරන ලද තේ නැවත වගා කිරීමේ අවසරපත්‍ර සම්බන්ධයෙන් 4 වැනි නියෝගයේ නියම කර ඇති අනුප්‍රමාණ අනුව සහනාධාර වාරික ගෙවනු ලැබිය හැකි ය.

(2) 2012 ජනවාරි මස 1 වැනි දිනට පෙර කුඩා තේ වතුවල රිකිලි පැළ කිරීමෙන් වර්ධනය කරන ලද තේ පැළ නැවත වගා කිරීම සඳහා නිකුත් කරන ලද වලංගු භාවය ඉකුත් නොවූ අවසර පත්‍ර සම්බන්ධයෙන් ගෙවිය යුතු සහනාධාර මුදල් ප්‍රමාණය එම අවසරපත්‍ර නිකුත් කරන අවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයෙන්ම විය යුතු අතර එහි නිශ්චිතව දක්වා ඇති ආකාරයටම ගෙවනු ලැබිය හැකි ය.".

4. එහි 6 වැනි නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"6. නැවත වගා කරන තිබෙන හෝ වගා කිරීමට ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාරයකට අඩුවන අවස්ථාවක හෝ එම ප්‍රමාණයට හෙක්ටයාරයකට වඩා අඩු කොටසක් ඇතුළත්වන අවස්ථාවක දී, ගෙවිය යුතු සහනාධාර මුදල ආගණනය කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි, එම බිම් ප්‍රමාණය හෝ ඉන් කොටසක් සඳහා අදාළ වන 3 වැනි නියෝගයේ (1) වැනි ඡේදයේ සහ 4 වැනි නියෝගයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ එම බිම් ප්‍රමාණය හෝ ඉන් කොටසක් එක් හෙක්ටයාරයකට දරන අනුපාතයට අදාළ විය යුතු ය.".

5. එහි 8 වැනි නියෝගය වෙනුවට දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"8. එහි 3 වැනි නියෝගය හෝ 4 වැනි නියෝගය හෝ 5 වැනි නියෝගය යටතේ ගෙවිය යුතු සහනාධාර වාරිකය අත්තිකාරම් මුදලක් වශයෙන් හෝ ද්‍රව්‍යාධාර වශයෙන් මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් ගෙවිය හැකි ය.".

11-865

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.